# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1986/6 - 2016 සැප්තැම්බර් මස 26 වැනි සඳුදා - 2016.09.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාර්යයන් ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමාට පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කෘෂිකර්ම අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල හා කාර්යයන්ගෙන් පහත උපලේඛනයේ දක්වා ඇති නිශ්චිත කාර්යයන් ඉටු කිරීමේ වගකීම් හා බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය වසන්ත ලක්ෂ්මිනාත් අලුවිහාරේ මැතිතුමා වෙත පවරනු ලබන බවත්, එසේම මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන සියළු කාර්යයන් සම්බන්ධයෙන් සොයා බැලීමේ, මැදිහත් වීමේ හා සම්බන්ධීකරණය කිරීමේ අවස්ථාව තවදුරටත් රාජ්‍ය අමාත්‍යවරයාට ඇති බවත් ප්‍රකාශයට පත් කරමි.

| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු පනත* |
|---|---|---|
| 1. විවිධ කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි නියැලෙන්නන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දීම, අධ්‍යාපන හා පර්යේෂණ අවස්ථා පුළුල් කිරීමට ක්‍රමවේද සැකසීම. | 1. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය | 1. 1972 අංක 5 දරන ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත |
| 2. කෘෂි නිෂ්පාදන මත පදනම් වූ ව්‍යවසායකයින් දිරි ගැන්වීම හා වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීමට පියවර ගැනීම. | 2. ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව. | 2. 1987 අංක 47 දරන ශ්‍රී ලංකා කෘෂි කාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව පනත |
| 3. දේශීය කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක අගය පාරිභෝගික ප්‍රජාව වෙත සහතික කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සකස් කිරීම. | 3. පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය | 3. 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ විධිවිධාන අදාළ වන පරිදි. |

දුමින්ද දිසානායක,
කෘෂිකර්ම අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
''ගොවිජන මන්දිරය''
අංක 80/5 රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල,
කෘෂිකර්ම අමාත්‍යාංශයේ දී ය.

10 - 211


1A - G 24263 — 367 (2016/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*